සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# පළමු වාර පරීක්ෂණය 2018
# පුරවැසි අධ්‍යාපනය

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.

---

- 1- 5 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

01. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවාව ............................................................................ සේවයයි.

(බැංකු, සෞඛ්‍ය, සමූපකාරය)

02. ''එකා සැමටත් සැම එකාටත්'' යන්න ............................................................................ ආදර්ශ පාඨයයි.

(පොලිසියේ, සමූපකාරයේ, තැපැල්)

03. පෘථිවි පෘෂ්ඨයෙන් 70% ක් ජලයෙන් වැසී පැවතියත් ඉන් ප්‍රයෝජන ගත හැක්කේ ...................................... ත් අඩු ප්‍රමාණයකි.

(2%, 3% 01%)

04. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාව ............................................................ රෝගය තුරන් කළ රටක් ලෙස මෑතකදී ප්‍රකාශයට පත්කරන ලදී.

(මැලේරියා, බරවා, ලාදුරු)

05. ඔබ ප්‍රදේශයේ පාසල්වල කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට .................................................... කාර්යාලය විශේෂ කාර්යභාරයක් ඉටු කරයි.

(කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, ජලාපවාහන මණ්ඩලය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය)

- ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල දී ඇති වගන්ති හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද තිත් ඉර මත ලියන්න.

06. ජලය මිනිස් පරිභෝජනයට සුදුසු ලෙස සකස් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ක්‍රියාකාරීව කටයුතු කරයි. (..........)

07. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වෛද්‍ය ක්‍රමයකි. (..........)

08. පාසල් හත්දාහකට ආසන්න සංඛ්‍යාවක් සංවර්ධනය වන්නේ ''ළඟම පාසල හොඳම පාසල'' යන සංකල්පය යටතේ ය. (..........)

09. වර්තමානයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ විස්තෘත පවුල් සංස්ථාවයි. (..........)

10. පාසල තුළ ජාතික උත්සව පැවැත්වීම ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයකට හුරු කිරීමේ විෂය සමගාමී ක්‍රියාකාරකමක් නොවේ. (..........)

- ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවල වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. වර්තමානයේ වර්ධනය වෙමින් පවතින බෝ නොවන රෝගයක් වන්නේ මින් කුමක් ද?

    (1) ඩෙංගු (2) ලාදුරු (3) වකුගඩු (4) බරවා

12. තැපැල් සේවාව මගින් ජනතාවට සපයන සේවාවක් වන්නේ මින් කුමක් ද?

    (1) ටෙලිමේල් (2) ආපදා අවස්ථාවල සේවා සැපයීම.

    (3) ණය පහසුකම් ලබා දීම. (4) නව දැනුම ලබා දීම.

13. ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් අනුබද්ධ ආයතනයක් වන්නේ මින් කුමක් ද?

    (1) උන්ක්ටාර්ඩ් (2) යුනිසෙෆ් (3) යුනෙස්කෝ (4) බිම්ස්ටෙක්

14. පහරදීම යන ප්‍රතික්‍රියාව අයත්වන්නේ මින් කුමන චිත්තවේගි තත්ත්වයක් තුළට ද?

    (1) සතුට (2) දුක (3) කෝපය (4) බිය

15. අයහපත් චිත්තවේග සමනය කිරීම සඳහා යොදාගත හැකි මනස සන්සුන් කිරීමේ හොඳම අභ්‍යාසයක් වන්නේ මින් කුමක් ද?

    (1) සාකච්ඡා කිරීම. (2) කාලසටහනකට වැඩ කිරීම.

    (3) චිත්‍රපට නැරඹීම (4) භාවනා කිරීම

- ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති පින්තූර ඇසුරින් හිස්තැන් පුරවන්න.

|  |  |  |  |  |
|---|---|---|---|---|
| A | B | C | D | E |

16. A රූපයෙන් දැක්වෙන්නේ අයහපත් චිත්තවේග පාලනය සඳහා ............................................... තත්ත්වයන් වෙනස් කළ අවස්ථාවකි.

17. B පින්තූරයෙන් දැක්වෙන යුනිසෙෆ් ආයතනයේ සංකේතය එක්සත් ජාතීන්ගේ ............................................ සුරැකීම සඳහා ක්‍රියාත්මක වන ආයතනය පිළිබිඹු කරන්නකි.

18. C පින්තූරයෙන් දැක්වෙන ලාංඡනයෙන් පෙන්වන්නේ ............................................... ක්ෂේත්‍රයට අයත් පොදු සේවාවකි.

19. D පින්තූරයෙන් දැක්වෙන්නේ අතීතයේ පැවති ..................................................... සේවාව පිළිබඳ නටබුන් සහිත ස්ථානයකි.

20. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනයට පුරෝගාමී වූ පුද්ගලයෙක් වන .............................. ...................................... මහතා E රූපයෙන් දැක්වේ.

(ලකුණු 40)

- **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 04 කටත් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් හිමිවන අතර අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් හිමි වේ.**

01. ජනතාවගේ ජීවන තත්වයේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් රජය හා පෞද්ගලික අංශය පොදු සේවා සපයනු ලැබේ.

(I) A හා B පින්තූර වලින් දැක්වෙන පොදු සේවා නම් කරන්න.





A ........................ B ........................ (ල. 02)

(II) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භකළ පොදු සේවා 2 ක් නම් කරන්න. (ල. 02)

(III) අත්‍යවශ්‍ය සේවා ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලබන ජනතාවට සහන සැලසීම සඳහා රජය විසින් නොමිලේ ලබා දෙන සේවාවන් දෙකක් නම් කරන්න. (ල. 02)

(IV) රජය හා ස්වේච්ඡා සංවිධාන එකතු වී ආර්ථික අපහසුතා ඇති අය සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක කරන සමාජ ආරක්ෂණ වැඩසටහන් 2ක් නම් කරන්න. (ල. 02)

(V) පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(VI) පහත සඳහන් වගු සටහනේ දරුවන් සම්බන්ධ අයිතිවාසිකම් දෙකක් දක්වා ඇත. ඊට අදාළ ළමා යුතුකම් දෙකක් ලියන්න.

| ළමා අයිතිවාසිකම් | ළමා යුතුකම් |
|---|---|
| අධ්‍යාපනය | 1. ........................ |
| මිතුරු සම්බන්ධතා පැවැත්වීම | 2. ........................ |

(ල. 02)

(VII) නායකයකු සතු විය යුතු ආවේදනීය හැකියා දෙකක් නම් කරන්න. (ල. 02)

(VIII) අයහපත් චිත්තවේගි තත්ත්වයන් දිගින් දිගටම පැවතීම නිසා පුද්ගලයා පිරිහීමට ලක්වන ආකාර දෙකක් නම් කරන්න. (ල. 02)

02. (I) ජලය සියලුම ජීවීන්ගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සම්පතකි. භූගත ජලය හා ගංගා ජලය අපවිත්‍ර වීමට බලපාන හේතුකාරක 3ක් නම් කරන්න. (ල. 03)

(II) ඔබට පාසලේ විෂය සමගාමී කටයුතුවලින් ලබාගත හැකි ප්‍රයෝජන කීපයක් පහත දැක්වේ ඒවා ලබාගත හැකි සංවිධානය ඉදිරියෙන් ලියා දක්වන්න.

| ප්‍රයෝජනය | සංවිධානය |
|---|---|
| 1. තර්කන හැකියාව දියුණු වීම. | ........................ |
| 2. කණ්ඩායමක් මෙහෙයවීමේ හැකියාව | ........................ |
| 3. ක්‍රීඩා කුසලතා දියුණු කර ගැනීම | ........................ |
| 4. ගායන වාදන නර්තන කුසලතා දියුණු වීම | ........................ |

(ල. 04)

(III) පහත පින්තූරයෙන් දැක්වෙන්නේ මගී ප්‍රවාහනය සම්බන්ධ මාධ්‍ය 4කි. එම ප්‍රවාහන මාධ්‍ය නම් කරන්න. (ල. 04)



A B C D

03. විදුලි බලාගාරවල හදිසියේ ඇතිවන කාර්මික දෝෂ නිසා වරින් වර විදුලි සැපයුම බිඳවැටේ.

(I) නිවසේ විදුලිය බිඳ වැටීමක් සිදු වූ අවස්ථාවක පාසල් දරුවකු ලෙස ඔබ මුහුණ දුන් ගැටළු 3ක් දක්වන්න. (ල. 03)

(II) පහත සඳහන් සේවාවන් සපයන ආයතන ඉදිරියෙන් ලියන්න.

| සේවාව | ආයතනය |
|---|---|
| 1. නීතිය හා සාමය සුරැකීම | ------------------------------ |
| 2. මුදල් ඇණවුම් මගින් මුදල් යැවීම | ------------------------------ |
| 3. පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම | ------------------------------ |
| 4 පිරිසිදු පානීය ජලය සැපයීම | ------------------------------ |

(ල. 04)


(III) පහත දැක්වෙන්නේ පොදු සේවා සපයන ආයතන මගින් ජනතාවට සපයන යුතුකම් හා වගකීම් කිහිපයකි. එයින් ජනමාධ්‍ය ආයතනයක් තුළින් ජනතාවට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් 4ක් තෝරා ලියන්න.

A මගී ආරක්ෂාව සහතික කිරීම.
B සත්‍ය තොරතුරු ජනතාවට සැපයීම.
C නිපුණතා සංවර්ධනය කිරීම.
D අපක්ෂපාතීව තොරතුරු සැපයීම.
E රෝගීන්ට නිසි ප්‍රතිකාර සැපයීම.
F හදිසි හා ස්වාභාවික විපත් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
G ගුණාත්මක සේවාවක් ජනතාවට ලබා දීම.
H ජලය අපතේ යාම වැළැක්වීම. (ල. 04)

04 පවුලේ සාමාන්‍ය කටයුතුවලදී මව පියා එක්ව සාකච්ඡාකර තීරණ ගැනීම පවුලේ සමගියට හා දියුණුවට හේතු වේ.

(I) එලෙස සාකච්ඡා කර තීරණ ගත හැකි කාර්යයන් 3ක් නම් කරන්න. (ල. 03)

(II) පහත හිස්තැනට සුදුසු ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ 4ක් දක්වන්න.




(ල. 04)

(III) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා විෂය සමගාමී කටයුත්තක් ලෙස ක්‍රියාත්මක වන සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් 4 ක් ලියන්න. (ල. 04)

05 වර්තමානයේ සමාජය තුළ දරුවන් විවිධ අපරාධවලට යොදාගැනීම ජනමාධ්‍ය තුළින් අසන්නට ලැබේ.

(I) එලෙස දරුවන්ට මුහුණදීමට සිදුවන අපචාර ක්‍රියා 3ක් දක්වන්න. (ල. 03)

(II) ප්‍රදේශීය මට්ටමෙන් දරුවන් හා පවුල් සඳහා සේවා සපයන නිලධාරීන් හා ආයතන ඇසුරින් පහත වගුවේ හිස්තැන් පුරවන්න. (ල. 04)

| තනතුර | කාර්යාලය | සපයන සේවාව |
|---|---|---|
| 1. ........................................ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දරුවන්ගේ අයිතීන් හා අදාල සේවා ලබා දීම. |
| ප්‍රදේශීය ළමා ආරක්ෂා නිලධාරී | 2. .................................................. | දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටළු විමර්ශනය |
| 3. ........................................ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 4. .................................................. |

(III) පහත සඳහන් වන්නේ අයහපත් චිත්තවේග පාලනයට ගතහැකි ක්‍රියාමාර්ග කීපයකි. ඒවා අදාළ පරිදි යා කරන්න. (ල. 04)

A මනස සන්සුන් කිරීමේ අභ්‍යාස

B මිතුරන් ඇසුරු කිරීම

1. භාවනා කිරීම
2. සාකච්ඡා කිරීම
3. ආගමික කටයුතුවල යෙදීම
4. චාරිකා යාම
5. නාට්‍ය නිර්මාණ
6. ශාරීරික ව්‍යායාම්වල යෙදීම.

06. (I) පහත සඳහන් නායකත්ව ලක්ෂණ දක්නට ලැබෙන්නේ කුමන ආයතන තුළින් ද? (ල. 03)

| | A | B |
|---|---|---|
| 1. | දෙමාපියන් | ............................................................ |
| 2. | විදුහල්පති | ............................................................ |
| 3. | දේශපාලන නායකයින් | ............................................................ |

(II) පහත දැක්වෙන්නේ සමාජය තුළ දක්නට ලැබෙන ඒකාධිපති හා දූෂිත නායකත්ව ශෛලීන් කීපයකි. ඒවා සුදුසු පරිදි පහත වගුවේ සඳහන් කරන්න.

1. වෙනස් විමට කැමති නොවීම.
2. පොදු දේපල අයුතු ලෙස පරිහරණය කිරීම.
3. පොදු ජනතා අදහස් නොපිළිගැනීම.
4. වැරදි පූර්වාදර්ශ ප්‍රදර්ශනය කිරීම.
5. ඒකමතිකව තීරණ ගැනීම.
6. පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම.
7. ඉතා දැඩිව ක්‍රියා කිරීම.
8. සොරකම් වංචා දූෂණ කටයුතුවල යෙදීම.

| ඒකාධිපති නායකත්ව ශෛලීන් | දූෂිත නායකත්ව ශෛලීන් |
|---|---|
| 1. . . . . . . . . . . . . . . . . . . . . . . . . | 1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 2. . . . . . . . . . . . . . . . . . . . . . . . . | 2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 3. . . . . . . . . . . . . . . . . . . . . . . . . | 3. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 4. . . . . . . . . . . . . . . . . . . . . . . . . | 4. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |

(ල. 08)

07. (I) සමාජයේ ආර්ථික අපහසුතා ඇති අය සවිබල ගැන්වීමේ අරමුණින් ක්‍රියාත්මක වන නිවාස සැපයීමේ වැඩසටහන් 2ක් ලියන්න. (ල. 02)

(II) ළමා අයිතිවාසිකම් පිළිබඳව දක්වා ඇති ප්‍රධාන තේමා 3ක් දක්වන්න. (ල. 03)

(III) පහත සඳහන් උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට

1. අනුරාධපුර යුගයේ ජනතාවට සැපයූ පොදු සේවාවකි.
2. මේවා නිසා පාසල් දරුවන්ට සහන මිලට ගමන් කළ හැකි ය.
3. මහජනයා සමග සුහදශීලීව කටයුතු කිරීම මෙම ආයතනයේ යුතුකමකි.

පහළට

1. ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට මොවුන් අයත් වේ.
2. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර හැතිතුමා වෙනස්කම් රැසක් කළේ මෙම සේවාව සම්බන්ධයෙනි.
3. මෙම නිෂ්පාදන කර්මාන්ත සමූපකාර සේවයට අයිති ය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 වා | 1 රි | | | | ■ | ■ |
| ■ | | ■ | ■ | ■ | 2 අ | ■ |
| ■ | | ■ | ■ | ■ | | ■ |
| 2 වා | | | | | | තු |
| ■ | | ■ | ■ | ■ | | ■ |
| 3 කො | ■ | 3 පො | | | | ■ |
| | ■ | ■ | ■ | ■ | ■ | ■ |

(ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | බැංකු | (2) | සමූපකාරයේ | (3) | 1% | (4) | මැලේරියා | (5) | නොවිධිමත් අධ්‍යාපන |
| (6) | ✓ | (7) | ✓ | (8) | ✓ | (9) | × | (10) | × |
| (11) | 3 | (12) | 1 | (13) | 2 | (14) | 3 | (15) | 4 |
| (16) | පරිසරය අලංකාර කිරීම | (17) | ළමා අයිතිවාසිකම් | (18) | ප්‍රවාහන | (19) | සෞඛ්‍ය | (20) | සී. ඩබ්. ඩබ්. කන්නන්ගර |

(2 x 20 = 40)

## II කොටස

01. (I) ජල සම්පාදනය, පණිවිඩ හුවමාරුව (ල. 02)
(II) ප්‍රවාහන, තැපැල්, විදුලි පණිවිඩ, බැංකු (ල. 02)
(III) සෞඛ්‍යය, අධ්‍යාපනය, (ල. 02)
(IV) ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා ශුභ සාධන වැඩසටහන්, වැඩිහිටි නිවාස පවත්වාගෙන යාම, නිවාස සැපයීමේ වැඩසටහන්. (ල. 02)
(V) දෙමාපිය වැඩිහිටි හා නායකත්වයට ගරු කිරීම. අන් මත ඉවසීම, සවන්දීම, සමානාත්මතාවය, ආදරය, රැකවරණය ලැබීම, ගැටළු නිරාකරණය, සාකච්ඡා මගින් තීරණයට එළඹීම, සාමූහිකත්වය. (ල. 02)
(VI) හොඳින් අධ්‍යාපනය ලැබීම, ගුරු දෙගුරුන්ට ගෞරව කිරීම, පාසලේ විනය නීති ආරක්ෂා කිරීම. නැණවත් මිතුරන් තෝරා ගැනීම, වයසට ගැළපෙන මිතුරන් තෝරා ගැනීම, සොරකම් වංචා වලින් වැලකීම. (ල. 02)
(VII) මිත්‍රශීලී බව, සුහද බව, සංවේදී බව, ප්‍රබෝධවත් බව (ල. 02)
(VIII) කායික රෝග, මානසික රෝග, ගැටුම් ඇතිකර ගැනීම, මත්ද්‍රව්‍යවලට ගොදුරු වීම. (ල. 16)

02. (I) කෘෂි රසායනික ද්‍රව්‍ය මගින්, රසායනික පොහොර භාවිතය, කර්මාන්තශාලාවලින් පිටවන අපද්‍රව්‍ය (ල. 03)
(II) 1. විවාද කණ්ඩායම 2. ශිෂ්‍ය නායක මණ්ඩලය 3. ක්‍රීඩා සමිතිය 4. සාහිත්‍ය සමිතිය
(III) 1. දුම්රිය 2. ශ්‍රී ලංකා බස්රථය 3. පෞද්ගලික බස් රථය 4. ගුවන් යානය

03. (I) පොත් පාඩම් කිරීම අපහසු වීම, රෙදි මැදීමට අපහසු වීම, දුරකථනය විසන්ධි වීම, රූපවාහිනිය නැරඹීමට නොහැකි වීම (ල. 03)
(II) ශ්‍රී ලංකා පොලීසිය, තැපැල් කාර්යාලය, සමූපකාරය, ජල සම්පාදනය හා ජලාපවාහණ මණ්ඩලය (ල. 04)
(III) සත්‍ය තොරතුරු ජනතාවට සැපයීම, අපක්ෂපාතීව තොරතුරු සැපයීම, හදිසි හා ස්වාභාවික විපත් ජනතාවට සැපයීම, ගුණාත්මක සේවා සැපයීම (ල. 04)

04. (I) නිවාස පිරිසිදුව තබා ගැනීම, ආහාර වේල් සකසා ගැනීම, අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම, නිවසේ වැඩ කටයුතු සාමූහිකව කිරීම. (ල. 03)
(II) 1. සෑම දෙනාගේම කැමැත්ත මත විමසීම හා එකඟවීම.
2. සහයෝගයෙන් කටයුතු කිරීම.
3. උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විඳීම.
4. පාසල තුළ පොදු නීති රීති සම්ප්‍රදායයන් පිළිගැනීම. (ල. 04)
(III) නර්තනය, ගායනය, වාදනය, චිත්‍ර ඇඳීම (ල. 04)

05. (I) ලිංගික අතවර, හිංසා කිරීම, ශ්‍රමිකයන් ලෙස යොදා ගැනීම. (ල. 03)
(II) 1. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. මුල් ළමාවිය සංවර්ධන නිලධාරී
4. පෙර පාසල් අධ්‍යාපනය හා මුල් ළමාවිය සේවාවන් ලබා දීම. (ල. 04)

06. (I) පවුල, පාසල, සමාජය (ල. 03)
(II) ඒකාධිපති - පොදු ජනතා අදහස් නොපිළිගැනීම, වෙහෙස වීමට කැමති නොවීම, ඒකමතික තීරණ ගැනීම, ඉතා දැඩිව ක්‍රියා කිරීම
දූෂිත - පොදු දේපල අයුතු ලෙස පරිහරණය කිරීම, සොරකම් වංචා දූෂණ කටයුතුවල නිරත වීම, වැරදි පූර්වාදර්ශ ප්‍රදර්ශනය කිරීම, පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම. (ල. 08)

07. (I) උදාගම් වැඩසටහන, සැමට සෙවන වැඩසටහන (ල. 02)
(II) ආරක්ෂාවට ඇති අයිතිය, සහභාගීත්වයට ඇති අයිතිය, සංවර්ධනයට ඇති අයිතිය, පැවැත්මට ඇති අයිතිය.
(III) හරහට - 1. වාරි මාර්ග, 2. වාර ප්‍රවේශපත්‍ර, 3. පොලීසිය
පහළට - 1. රියදුරන්, 2. අධ්‍යාපනය, 3. කොහු (ල. 06)